සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2026
Third Term Test - Grade 13 - 2026

විභාග අංකය: ..............................

## ගිණුම්කරණය - I

කාලය පැය 02 යි

උපදෙස්:-

- අංක 01 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.
- අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු හතර බැගින් හිමි වේ.
- විභාග අංකය ඉහළින් ඇති තිත් ඉර මත පැහැදිලි ව සටහන් කරන්න.

| ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

(01) ව්‍යාපාර ආයතනයක ගිණුම්කරණ ක්‍රියාවලියේ ප්‍රභේද දෙක වන්නේ,
(1) පොදු පරමාර්ථ ගිණුම්කරණය හා විශේෂිත පරමාර්ථ ගිණුම්කරණය යි.
(2) මූල්‍ය ගිණුම්කරණය හා පොදු පරමාර්ථ ගිණුම්කරණය යි.
(3) මූල්‍ය ගිණුම්කරණය හා කළමනාකරණ ගිණුම්කරණය යි.
(4) පිරිවැය ගිණුම්කරණය හා කළමනාකරණ ගිණුම්කරණය යි.
(5) ගනුදෙනු ගිණුම්ගත කිරීම හා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමයි. (........)

- ප්‍රශ්න අංක 2 සහ 3 සඳහා පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු භාවිතා කරන්න.

ව්‍යාපාරයක 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී පහත ගනුදෙනු සිදු වී ඇත.

A - ව්‍යාපාරයේ මෝටර් රථය එහි සාධාරණ අගය වූ රු. 6,500,000 ට ප්‍රත්‍යාගණනය කර ඇත.

B - ගනුදෙනුකරුවකුගෙන් විකුණුම් අත්තිකාරම් ලෙස ලද රු. 85 000 ක් නොඉපයූ ආදායම් ගිණුමට බැරකර ඇත.

(02) ඉහත A ගනුදෙනුව සටහන් කිරීමේදි කඩවීමට ලක්වී ඇති ගිණුම්කරණ සංකල්පය වන්නේ,
(1) ඒකක (2) ඓතිහාසික පිරිවැය (3) මූල්‍ය මිනුම්
(4) උපචිත (5) ගැලපුම් (........)

(03) ඉහත B ගනුදෙනුව සටහන් කිරීමේදී අදාළ ගිණුම්කරණ සංකල්පය කුමක්ද?
(1) සංගතතා (2) මූල්‍ය මිනුම් (3) අඛණ්ඩ පැවැත්ම
(4) කාලච්ඡේද (5) උපලබ්ධි (........)

04) ව්‍යාපාරයක ගිණුම්කරණ ක්‍රියාවලියට බලපෑම් ඇති කරන ශිල්පීය හා වෘත්තීය පරිසරයට අයත් සාධක පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,
(1) බදු ප්‍රතිපත්තිය, ගිණුම්කරණ ප්‍රමිත, 2007 අංක 07 දරණ සමාගම් පනත
(2) විනිමය අනුපාත, දේශීය ආදායම් බදු පනත, ගිණුම්කරණ ශිල්ප ක්‍රම
(3) ගිණුම්කරණ ප්‍රමිත, දේශීය ආදායම් පනත, රාජ්‍ය ප්‍රතිපත්ති
(4) ගිණුම්කරණ වෘත්තීය ආයතන, ගිණුම්කරණ ශිල්ප ක්‍රම, ගිණුම්කරණ ප්‍රමිත
(5) බදු ප්‍රතිපත්තිය, විනිමය අනුපාත, මිල මට්ටම්. (........)

අංක 5, 6, 7 සහ 8 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු භාවිතා කරන්න.

මාලක විසින් ඔහු සතුව තිබූ රු. 500 000 ක මුදලක් සහ බැංකු ණය මගින් ලබාගත් රු. 400 000 ක මුදලක් යොදා ව්‍යාපාරයක් ආරම්භ කළ අතර, එය 18% VAT සඳහා ලියාපදිංචි කර ඇත. පහත ගනුදෙනු මුල් මාසය තුළ සිදු වී ඇත.

1. රු. 708 000 (VAT සහිත මිල) ට භාණ්ඩ ණයට මිලදී ගත්තා.
2. රු. 120 000 ක බැංකු ණය වාරිකය ගෙව්වා. එහි ඇතුළත් පොළිය රු. 20 000 කි.
3. මිලටගත් භාණ්ඩ සියල්ල රු. 885 000 (VAT සහිත මිල) ට ණයට වික්කා.

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
Scanned with CamScanner

(05) ගනුදෙනු අංක 1, 2 සහ 3 හි ශුද්ධ බලපෑම පහත කුමන ගිණුම්කරණ සමීකරණයෙන් පෙන්වනු ලබයිද?

| | වත්කම් (රු. '000) | = | වගකීම් (රු. '000) | + | හිමිකම් (රු. '000) |
|---|---|---|---|---|---|
| (1) | +900 | | +400 | | +500 |
| (2) | +708 | | +708 | | - |
| (3) | +873 | | +743 | | +130 |
| (4) | +1773 | | +1008 | | +765 |
| (5) | +1773 | | +1143 | | +630 |

(........)

(06) මාලක ව්‍යාපාරයේ ඉහත ගනුදෙනු සටහන් කිරීමට භාවිතා කරන උපයෝගී පොත්,
(1) මුදල් ලැබීම් ජ'නලය, ගැනුම් ජ'නලය, මුදල් ගෙවීම් ජ'නලය, විකුණුම් ජ'නලය
(2) පොදු ජ'නලය, ගැනුම් ජ'නලය, මුදල් ගෙවීම් ජ'නලය, විකුණුම් ජ'නලය
(3) පොදු ජ'නලය, මුදල් ගෙවීම් ජ'නලය, විකුණුම් ජ'නලය, ආපසු යැවුම් ජ'නලය
(4) මුදල් ලැබීම් ජ'නලය, ගැනුම් ජ'නලය, පොදු ජ'නලය, විකුණුම් ජ'නලය
(5) ගැනුම් ජ'නලය, මුදල් ගෙවීම් ජ'නලය, විකුණුම් ජ'නලය, පොදු ජ'නලය (........)

(07) ගනුදෙනු අංක 2 සටහන් කිරීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන කුමක්ද?

| | විස්තරය | | හර (රු. '000) | බැර (රු. '000) |
|---|---|---|---|---|
| (1) | මුදල් ගිණුම | හර | 120 | |
| | බැංකු ණය ගිණුම | බැර | | 120 |
| (2) | බැංකු ණය ගිණුම | හර | 120 | |
| | මුදල් ගිණුම | බැර | | 120 |
| (3) | ණය පොළී ගිණුම | හර | 20 | |
| | මුදල් ගිණුම | බැර | | 20 |
| (4) | බැංකු ණය ගිණුම | හර | 100 | |
| | මුදල් ගිණුම | බැර | | 100 |
| (5) | ණය පොළී ගිණුම | හර | 120 | |
| | මුදල් ගිණුම | බැර | | 120 |

(........)

(08) මාලක ව්‍යාපාරයේ ඉහත ගනුදෙනුවලින් පසුව බංකු ණය ගිණුමේ ශේෂය සහ VAT ගිණුමේ ශේෂය

| | බැංකු ණය ගිණුමේ ශේෂය (රු. '000) | VAT ගිණුමේ ශේෂය (රු. '000) |
|---|---|---|
| (1) | 400 හර | 108 හර |
| (2) | 400 බැර | 27 බැර |
| (3) | 280 බැර | 135 බැර |
| (4) | 300 බැර | 27 බැර |
| (5) | 280 බැර | 27 බැර |

(........)

- අංක 9 සහ 10 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.

2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති අතර පසුව කරන ලද ගිණුම් පරීක්ෂාවේදී පහත වැරදි අනාවරණය වී ඇත.

A - රු. 15 000 ක භාණ්ඩ තොග හානියක් ගිණුම් පොත්වල සටහන් කර නොතිබුණි. කෙසේ වෙතත් භෞතික තොගයේ වටිනාකම භාවිතා කර ලාභය ගණනය කර තිබුණි.

B - රු. 12 000 ආපසු එවුම් ණයගැති පාලන ගිණුමේ නිවැරදිව සටහන් කර ඇති අතර ආපසු යැවුම් ගිණුමට බැර කර ඇත.

C - 2025.03.31 දිනට ලැබූ බැංකු ප්‍රකාශනයේ සඳහන් වූ බැංකු ගාස්තු රු. 6 000 ක් සහ සෘජු ප්‍රේෂණ ලෙස ලද රු. 8 000 ආයෝජන ආදායම් සංශෝධිත මුදල් ගිණුමේ පමණක් ලියා ඇත.

(09) ඉහත වැරදි නිසා 2025.03.31 දිනට සකස්කල ශේෂ පිරික්සුමේ ඇති වී තිබූ වෙනස වන්නේ,
(1) හර තීරුව රු. 10 000 අඩු වී ඇත. (2) හර තීරුව රු. 22 000 වැඩි වී ඇත.
(3) බැර තීරුව රු. 10 000 අඩු වී ඇත. (4) බැර තීරුව රු. 22 000 අඩු වී ඇත.
(5) හර තීරුව රු. 22 000 අඩු වී ඇත. (........)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub
Scanned with CamScanner

(10) ඉහත වැරදි නිවැරදි කළ පසු 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දළ ලාභයෙහි හා ශුද්ධ ලාභයෙහි ශුද්ධ අඩුවීම හෝ වැඩි වීම වන්නේ,

| | දළ ලාභය | ශුද්ධ ලාභය |
|---|---|---|
| (1) | රු. 6000 කින් වැඩි වේ. | රු. 7000 කින් අඩු වේ. |
| (2) | රු. 6000 කින් අඩු වේ. | රු. 7000 කින් වැඩි වේ. |
| (3) | රු. 9000 කින් අඩු වේ. | රු. 7000 කින් අඩු වේ. |
| (4) | රු. 9000 කින් අඩු වේ. | රු. 22000 කින් අඩු වේ. |
| (5) | රු. 24000 කින් අඩු වේ. | රු. 30000 කින් අඩු වේ. |

(.......)

(11) 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා යෝගට් නිෂ්පාදන ව්‍යාපාරයක පහත තොරතුරු දැකිය හැකිය.

| | |
|---|---|
| සෘජු ද්‍රව්‍ය පිරිවැය (5000 ලීටර්) | රු. 500 000 |
| සෘජු ශ්‍රම පිරිවැය | රු. 101 000 |
| නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය | රු. 303 000 |

අතිරේක තොරතුරු

- කිරි ලීටරයකින් යෝගට 10 ක් නිෂ්පාදනය කරනු ලබයි.
- සෘජු ද්‍රව්‍ය පිරිවැය ගණනය කිරීමේදී නරක් වීම නිසා භාවිතයෙන් ඉවත්කළ කිරි ලීටර් 400 ක සහ නිෂ්පාදන ක්‍රියාවලියේදී සිදු වූ කිරි ලීටර් 100 ක අපතේ යාම සැලකිල්ලට ගෙන නොමැත.

වර්ෂය තුළ නිෂ්පාදනය කළ යෝගට් එකක මුළු නිෂ්පාදන පිරිවැය කොපමණද?

(1) රු. 18 (2) රු. 18.08 (3) රු. 20 (4) රු. 20.08 (5) රු. 22 (........)

(12) මහී ව්‍යාපාරය ගිණුම් වාර්තා නිසි පරිදි පවත්වාගෙන ගොස් නොමැති අතර පහත තොරතුරු දැකිය හැකිය.

| | | |
|---|---|---|
| 2024.04.01 දිනට | - තොගය | රු. 50 000 |
| | ණයහිමියෝ | රු. 240 000 |

- වර්ෂය තුළ ණයහිමියන්ට ගෙවූ මුදල් රු. 650 000 වූ අතර තොගයේ වැඩි වීම හා ණයහිමියෝ අඩුවීම පිළිවෙලින් රු. 10 000 සහ රු. 40 000 කි.
- ව්‍යාපාරය විකුණුම් මිල මත 20% ලාභාන්තිකයක් තබාගෙන භාණ්ඩ විකුණනු ලබයි.

2025.03.31 දිනෙන් අවසන් වර්ෂයේ මුළු විකුණුම් ආදායම සහ දළ ලාභය වන්නේ,

| | මුළු විකුණුම් ආදායම (රු. 000) | දළ ලාභය (රු. 000) |
|---|---|---|
| (1) | 625 | 125 |
| (2) | 625 | 100 |
| (3) | 625 | 130 |
| (4) | 780 | 125 |
| (5) | 780 | 130 |

(........)

(13) 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 42 වන වගන්තියට අනුව පහත කුමන ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?

A - හවුල්කරුවන් ව්‍යාපාරයට සපයන ණය සඳහා 5% පොලියක් ගෙවිය යුතුය.

B - විශ්‍රාම යන හවුල්කරුවකුට ඔහුගේ හිමිකම ගෙවිය යුතු අතර එසේ නොගෙවන්නේ නම් එම මුදල ණය ගිණුමකට මාරුකර පවත්වාගෙන යා යුතුය.

C - නව හවුල්කරුවකු බඳවාගත හැක්කේ වර්ෂය මුල හෝ අග දිනයේදී පමණි.

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.

(4) A, B පමණි. (5) B, C පමණි. (........)

- අංක 14, 15 සහ 16 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු භාවිතා කරන්න.

අකිල සහ නිකිල විසින් 2 : 1 අනුපාතයට ලාභාලාභ බෙදා ගනිමින් පවත්වාගෙන යන හවුල් ව්‍යාපාරයේ 2024.04.01 දිනට පහත තොරතුරු දැකිය හැකි විය. (රු. 000)

| | | |
|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම් ශේෂ | රු. 11 000 | (ලාභාලාභ අනුපාතයට ප්‍රාග්ධනයට දායක වී ඇත.) |
| ජංගම ගිණුම් ශේෂ | රු. 1800 | |

2024.04.01 දින ප්‍රාග්ධනය හා කීර්තිනාමය ලෙස රු. 2 000 000 යොදා 1/5 ලාභ කොටසක් ලබාගනිමින් සකිල නව හවුල්කරුවෙකු ලෙස ව්‍යාපාරයට බැඳුණි.

නව හවුල් ගිවිසුමේ කොන්දේසි පහත පරිදි විය.

ගලපන ලද ප්‍රාග්ධන ශේෂය මත 10% පොලී ගෙවීම සකිලගේ ප්‍රාග්ධන ගිණුමේ 2025.03.31 දිනට ශේෂය රු. 1 400 000 විය. අකිලට වර්ෂය තුළ බෙදාහරින ලද මුළු ලාභය රු. 1 340 000කි.

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub
Scanned with CamScanner

(14) සකිල බැදවාගත් පසු නව ලාභාලාභ අනුපාතය කුමක්ද?

(1) 2 : 1 : 1 (2) 2 : 2 : 1 (3) 8 : 4 : 2
(4) 8 : 4 : 4 (5) 8 : 4 : 3 (........)

(15) 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරය ඉපයූ මුළු ලාභය වන්නේ (රු. 000)

(1) රු. 1300 (2) රු. 1500 (3) රු. 1340
(4) රු. 2800 (5) රු. 3000 (........)

(16) 2025.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ මුළු හිමිකම.

(1) රු. 1800 (2) රු. 13 000 (3) රු. 17160
(4) රු. 19600 (5) රු. 21900 (........)

(17) 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සී/ස සමාගමක් ඉපයූ ලාභය රු. 3 400 000 කි. කෙසේ වුවද 2024.04.01 දින මිලට ගත් යන්ත්‍රයක් පිළිබඳව පොත්වල සටහන්කර නැත. මිලට [illegible]න්ත්‍රය පිළිබඳ පහත තොරතුරු සැපයේ.

| | (රු. '000) |
|---|---|
| ගැනුම් මිල (18% VAT සහිතව) | 1416 |
| සවිකිරීමේ ගාස්තු | 200 |
| පර්යේෂණ ධාවන වියදම් | 150 |
| පර්යේෂණ ධාවන නිමැවුම් විකුණුම් ආදායම් | 80 |
| සේවකයින් පුහුණු කිරීමේ ගාස්තු | 100 |
| වැඩබිම සකස් කිරීමේ ගාස්තු | 100 |
| ඵලදායි ජීවකාලය වසර 10 කි. | |

යන්ත්‍රයේ ආරම්භක පිරිවැය සහ 2025.03.31 දිනෙන් අවසන් වර්ෂයේ නිවැරදි ලාභය

| | යන්ත්‍රයේ ආරම්භක පිරිවැය (රු. '000) | නිවැරදි ලාභය (රු. '000) |
|---|---|---|
| (1) | 1500 | 3180 |
| (2) | 1500 | 3250 |
| (3) | 1946 | 3250 |
| (4) | 1946 | 3180 |
| (5) | 2046 | 3250 |

(........)

(18) 2024.04.01 දින කල්බදු පදනමට මිලට ගත් මෝටර් රථයක් පිළිබඳ පහත තොරතුරු සැපයේ.

- මූලික තැන්පතුව ලෙස ගෙවූ මුදල රු. 2 000 000
- කල්බදු කාලය වසර 05 ක් වන අතර වාර්ෂික කල්බදු වාරිකයක් රු. 1 200 000
- 10% වට්ටම් සාධකය පහත පරිදි වේ.

| වර්ෂය | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| වට්ටම් සාධකය | 0.91 | 0.83 | 0.75 | 0.68 | 0.62 |

කල්බදු ගෙවීම්වල වර්තමාන අගය සහ භාවිත අයිතිය සහිත වත්කමේ ආරම්භක පිරිවැය

| | කල්බදු ගෙවීම් වල වර්තමාන අගය (රු. '000) | භාවිත අයිතිය සහිත වත්කමේ පිරිවැය (රු. '000) |
|---|---|---|
| (1) | 4548 | 4548 |
| (2) | 4548 | 6548 |
| (3) | 6000 | 4548 |
| (4) | 6000 | 6548 |
| (5) | 6000 | 6000 |

(........)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
Scanned with CamScanner

- අංක 19 සහ 20 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු භාවිතා කරන්න.

2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සී/ස මලිත් සමාගමේ පහත තොරතුරු සැපයේ.

| | (රු.' 000) |
|---|---|
| දළ ලාභය | 12000 |
| වර්ෂය සඳහා ලාභය | 8 000 |
| කාලච්ඡේදයේ මුළු විස්තීර්ණ ආදායම | 9000 |
| ඉඩම ප්‍රත්‍යාගණන අලාභය | 500 |

ඉහත ශේෂයන් ගණනය කිරීමේදී පහත තොරතුරු සැලකිල්ලට ගෙන නැත.

1. ඉඩම 2023.04.01 දින පළමුවරට සිදුකළ ප්‍රත්‍යාගණනයෙන් රු. 300 000 ලාභයක් ලැබීම.
2. මෝටර්රථය 2023.03.31 දින සිදුකළ ප්‍රත්‍යාගණනයෙන් ජනිත වූ රු. 400 000 අලාභය

(19) 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ සිදුකළ මෝටර්රථ ප්‍රත්‍යාගණනයෙන් ජනිත වූ ප්‍රත්‍යාගණන අතිරික්තය හෝ ඌනතාවය කොපමණද?

(1) රු. 300 000 ප්‍රත්‍යාගණන ඌණතාවයක් (2) රු. 300 000 ප්‍රත්‍යාගණන අතිරික්තයක්
(3) රු. 400 000 ප්‍රත්‍යාගණන අතිරික්තයක් (4) රු. 1 000 000 ප්‍රත්‍යාගණන ඌණතාවයක්
(5) රු. 1 000 000 ප්‍රත්‍යාගණන අතිරික්තයක් (........)

(20) 2025.03.31 දිනෙන් අවසන් වර්ෂයේ නිවැරදි කාලච්ඡේදයේ ලාභය සහ වෙනත් විස්තීර්ණ ආදායම වන්නේ

| | කාලච්ඡේදයේ ලාභය (රු.' 000) | වෙනත් විස්තීර්ණ ආදායම (රු.' 000) |
|---|---|---|
| (1) | 7 700 | 200 |
| (2) | 7 700 | 600 |
| (3) | 8 700 | 300 |
| (4) | 8 700 | 400 |
| (5) | 9 000 | 300 |

(........)

(21) LKAS 37 - (ප්‍රතිපාදන අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්) ප්‍රමිතියට අනුව පහත කුමන ප්‍රකාශය / ප්‍රකාශන නිවැරදි වේද?

A - අසම්භාව්‍ය වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හඳුනාගනු ලබන්නේ විය හැකි බැඳීම ඇතිවිට පමණි.

B - අසම්භාව්‍ය වත්කම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හඳුනා නොගත යුතුය.

C - අනාගත මෙහෙයුම් අලාභ සඳහා ප්‍රතිපාදන හඳුනාගත යුතුය.

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A හා B පමණි. (5) B හා C පමණි. (........)

(22) LKAS 08 - (ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස් වීම් සහ වැරදි) ප්‍රමිතියට අනුව ප්‍රතිපත්ති වෙනස්වීමක් ලෙස සලකනු ලබන්නේ

A - දේපළ පිරියත හා උපකරණ පන්තියක මිනුම් කිරීමේ පදනම පිරිවැය ආකෘතියේ සිට ප්‍රත්‍යාගණන ආකෘතියට වෙනස් කිරීම.

B - තොග අගය කිරීමට යොදාගනු ලබන පිරිවැය සූත්‍රය භරිත සාමාන්‍ය පිරිවැය (WAC) ක්‍රමයේ සිට පෙර පිවිසි - පෙර පිට (FIFO) ක්‍රමයට වෙනස් කිරීම

C - ක්ෂය ක්‍රමය සරල මාර්ග ක්‍රමයේ සිට හීනවන ශේෂ ක්‍රමයට වෙනස් කිරීම.

(1) A පමණි. (2) B පමණි. (3) A හා B පමණි.
(4) A හා C පමණි. (5) A, B හා C යන සියල්ල ම (........)

23) සිමිත සදරු සමාගම වායුසමීකරණ යන්ත්‍ර විකුණනු ලබයි. මෙම යන්ත්‍ර ස්ථාපනය කිරීමේ දැනුම මෙම සමාගම සතුවන බැවින් ස්ථාපනය කිරීම සමාගම මගින් ම කරනු ලබයි. පළමු වසර අවසානයේ යන්ත්‍ර නඩත්තු සේවාවද සමාගමෙන් ලබාගත හැකිය. නඩත්තු සේවාව සමාගමෙන් ලබාගන්නේ නම් එක් එක් මිල සඳහා 10% වට්ටමක් ලබාදෙනු ලැබේ.

PAST PAPERS WIKI
www.iexamhub.com Your Trusted Partner for Exam Success Past Papers Model Answers - Study Resources
Scanned with CamScanner

2026.03.31 දිනෙන් අවසන් වසර තුළ සමාගම විසින් විකුණූ සහ සවිකළ යන්ත්‍ර පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | මිල / ගාස්තුව (රු. 000) | ප්‍රමාණය |
|---|---|---|
| විකුණන ලද යන්ත්‍ර | 3000 | 30 |
| සවිකරන ලද යන්ත්‍ර | 1500 | 25 |
| සමාගමෙන් නඩත්තු සේවා ලබාගත් යන්ත්‍ර | 500 | 15 |

SLFRS 15 - (ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම්) ප්‍රමිතියට අනුව 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගත යුතු මුළු ආදායම (රු. 000)

(1) 117 500 (2) 126 000 (3) 135 000
(4) 137 000 (5) 150 000 (........)

(24) සීමිත අමාලි සමාගම 2025. 04. 01 දින මෙහෙයුම් කටයුතු ආරම්භ කළ අතර 2026.03.31 දිනෙන් අවසන් වර්ෂයේ පහත තොරතුරු දැකගත හැකි විය.

- සංචිත ප්‍රාග්ධනීත කිරීම රු. 300 000
- ගෙවූ ආදායම් බදු රු. 150 000
- ගෙවූ ලාභාංශ රු. 240 000

2026.03.31 දිනට
- රඳවාගත් ඉපැයුම් රු. 1 260 000
- ගෙවිය යුතු බදු රු. 350 000

LKAS 07 - (මුදල් ප්‍රවාහ ප්‍රකාශන) ප්‍රමිතියට අනුව 2026.03.31 දිනෙන් අවසන් වර්ෂයේ බදු පෙර ලාභය වන්නේ (රු. 000)

(1) 1260 (2) 1760 (3) 2060
(4) 2300 (5) 2640 (........)

- අංක 25 සහ 26 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු භාවිතා කරන්න.

2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
- විකුණුම් රු. 450 000
- දළ ලාභ අනුපාතය 20%
- ජංගම අනුපාතය වාර 4

2026.03.31 දිනට - ජංගම වගකීම් රු. 40 000
තොගය රු. 90 000

(25) 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා තොග පිරිවැටුම් අනුපාතය සහ ක්ෂණික වත්කම් අනුපාතය

| | තොග පිරිවැටුම් අනුපාතය (වාර) | ක්ෂණික වත්කම් අනුපාතය (වාර) |
|---|---|---|
| (1) | 4 | 1.75 |
| (2) | 4 | 2 |
| (3) | 6 | 2.4 |
| (4) | 5 | 1.75 |
| (5) | 6 | 1.75 |

(........)

(26) ක්ෂණික වත්කම් අනුපාතයේ අගය වැඩි වීමට බලපාන ගනුදෙනුව / ගනුදෙනු වන්නේ,

A - ණයහිමියන්ට රු. 26 000 ගෙවීම.
B - ණයගැතියන්ගෙන් රු. 91 000 ලැබීම.
C - රු. 40 000 තොග ණයට මිල දී ගැනීම.

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A හා C පමණි. (5) A, B හා C යන සියල්ලම (........)

(27) සීමිත සමනල සමාගමේ 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සැපයේ. (රු. 000)

| | |
|---|---|
| පරිපාලන වියදම් | 12 500 |
| ගෙවිය යුතු EPF | 300 |

සේවක අර්ථසාධක අරමුදලට (EPF) සේව්‍ය සහ සේවක දායකත්වය පිළිවෙළින් 15% හා 10% වේ. සේවක භාරකාර අරමුදල (ETF) සඳහා 3% දායක වේ. මෙම දායකයන් සේවක දළ වැටුප මත ගණනය කෙරේ.

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub
Scanned with CamScanner

සමාගම EPF හා ETF දායකත්වයන් වාර්ෂික පදනමට ගෙවනු ලබන අතර සේවක EPF දායකය හිඳුම්ගත කිරීම හැර වෙනත් කිසිදු සටහනක් තබා නැත.

2026.03.31 දිනෙන් අවසන් වර්ෂයේ සේවකයන්ට අදාළව හඳුනාගත් මුළු වියදම සහ ගෙවිය යුතු EPF කොපමණද?

| | සේවකයන්ගේ මුළු වියදම (රු. 000) | ගෙවිය යුතු EPF (රු. 000) |
|---|---|---|
| (1) | 3000 | 300 |
| (2) | 3450 | 450 |
| (3) | 3540 | 750 |
| (4) | 3540 | 840 |
| (5) | 4150 | 840 |

(........)

(28) නිෂ්පාදන සමාගමක පොදු කාර්ය පිරිවැය සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?

A - පොදුවේ දරණ ලද නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය, පිරිවැය මධ්‍යස්ථානවලට විභාජනය කෙරේ.

B - විචල්‍ය පොදු කාර්ය පිරිවැය භාණ්ඩයකට සෘජුවම හඳුනාගත හැකිය.

C - මුළු පිරිවැය හා මුළු නිෂ්පාදන පිරිවැය අතර වෙනස නිෂ්පාදන නොවන පොදු කාර්ය පිරිවැය වේ.

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A හා C පමණි. (5) A, B හා C යන සියල්ලම (........)

(29) සීමිත මාලි සමාගම තනි භාණ්ඩයක් නිෂ්පාදනය කරනු ලබන අතර වාර්ෂික ධාරිතාව ඒකක 8000 දී පහත තොරතුරු ඉදිරිපත් කෙරේ.

- ඒකකයක දායකය රු. 60
- දායක විකුණුම් අනුපාතය 40%
- ඒකකයක ලාභය රු. 22.50

මෙම ක්‍රියාකාරී මට්ටමේදී සමාගමේ මුළු විචල්‍ය පිරිවැය සහ මුළු ස්ථාවර පිරිවැය

| | මුළු විචල්‍ය පිරිවැය (රු.' 000) | මුළු ස්ථාවර පිරිවැය (රු.' 000) |
|---|---|---|
| (1) | 480 | 180 |
| (2) | 720 | 180 |
| (3) | 720 | 300 |
| (4) | 1020 | 300 |
| (5) | 1200 | 720 |

(........)

(30) සාලිය සමාගම නව පරිගණක පද්ධතියක් ස්ථාපනය කිරීමට සලකා බලමින් සිටී. ඒ පිළිබඳ පහත තොරතුරු සැපයේ.

- ගැනුම් මිල රු. 6000 000
- ඵලදායි ජීව කාලය වර්ෂ 5
- සුන්බුන් අගය රු. 500 000
- වර්ෂයේ ලාභය

| වර්ෂය | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| ලාභය (රු. '000) | 600 | 650 | 950 | 900 | 1050 |

මෙම ව්‍යාපෘතියේ 5 වර්ෂයේ මුදල් ප්‍රවාහය සහ පිළිගෙවුම් කාලය

| | 5 වර්ෂයේ මුදල් ප්‍රවාහය (රු. 000) | පිළිගෙවුම් කාලය (වර්ෂ) |
|---|---|---|
| (1) | 1050 | 3 |
| (2) | 2150 | 3 මාස 3 |
| (3) | 2650 | 3 මාස 3 |
| (4) | 2650 | 4 |
| (5) | 6000 | 4 මාස 6 |

(........)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
Scanned with CamScanner

- අංක 31 සිට 50 දක්වා ප්‍රශ්නවලට කෙටි පිළිතුරු හිස් ඉරි මත ලියන්න.

(31) ආයතනයක් විසින් පිළියෙල කරන පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන කිපයක් පහත දී ඇත.

A - ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තිර්ණ ආදායම් ප්‍රකාශනය

B - මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

C - මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

D - හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය

ඉහත සඳහන් කර ඇති එක් එක් මූල්‍ය ප්‍රකාශනය මගින් ඇල්මැති පාර්ශවයන් අවදානය යොමු කරනු ලබන්නේ කුමන තොරතුරු ද යන්න දී ඇති ලැයිස්තුවෙන් තෝරන්න.

(1) මූල්‍ය තත්ත්වයේ වෙනස් වීම.

(2) මූල්‍ය ප්‍රතිඵලය

(3) නිශ්චිත දිනකට මූල්‍ය තත්ත්වය

(4) හිමිකමේ ඇති වූ වෙනස

| <u>මූල්‍ය ප්‍රකාශනය</u> | <u>අවධානය යොමු කරන තොරතුර</u> |
|---|---|
| A | ............................................... |
| B | ............................................... |
| C | ............................................... |
| D | ............................................... |

(32) ව්‍යාපාරයක 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ පහත සිද්ධීන් ඇති විය.

- වර්ෂය තුළ මුළු වත්කම්වල අඩුවීම රු. 500 000
- වර්ෂය තුල මුළු වගකීම් අඩුවීම රු. 750 000
- වර්ෂය තුළ ව්‍යාපාරයේ භාවිත අයිතිය සඳහා ගත් මෝටර් රථයේ කල්බදු වාරිකය අයිතිකරු පෞද්ගලික මුදලින් ගෙවීම රු. 80 000
- අයිතිකරු තම දරුවාගේ උපන්දිනය වෙනුවෙන් ව්‍යාපාරය සතු රු. 20 000 පරිත්‍යාග කරන ලදී.

2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත දෑ

(අ) ලාභය : රු. ..................................................

(ආ) රදවාගත් ඉපයුම් රු. ..................................................

(33) "හෙළ රස" සහල් නිෂ්පාදකයින්ගේ සිදුවූ පහත එක් එක් ගනුදෙනුව සටහන් කිරීම සඳහා භාවිත කරනු ලබන මූලාශ්‍ර ලේඛණය කුමක්ද?

| ගනුදෙනුව | මූලාශ්‍ර ලේඛනය |
|---|---|
| A - ගොවින්ගෙන් අත්පිට මුදලට වී මිලදී ගැනීම. | ............................................... |
| B - සහල් සැකසීමේ පැරණි යන්ත්‍රය ණයට විකිණීම. | ............................................... |
| C - සත්ව ආහාර නිපදවීම සඳහා කැඩුණු සහල් අත්පිට මුදලට විකිණීම. | ............................................... |
| D - තොග වෙළෙඳුන්ට ණයට විකුණු සහල් තොගයක් ආපසු එවීම. | ............................................... |

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
Scanned with CamScanner

(34) පහත සඳහන් දෑ සටහන් කිරීම සඳහා අවශ්‍ය ද්විත්ව සටහන් ලියන්න.

(අ) ණයට විකුණු භාණ්ඩ ණයගැතියන් විසින් ආපසු එවීම රු. 236 000 (ඇතුලත් VAT රු. 36 000)

(ආ) සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම රු. 12 600

විස්තරය　　　　　　හර　　　　　　බැර

(අ) ආපසු එවුම් සටහන් කිරීම.

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

(ආ) සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම.

.................................................................................................................................

.................................................................................................................................

(35) ආයතනයක පොදු ලෙජරයේ පවත්වාගෙන යනු ලබන පහත එක් එක් ගිණුම් සඳහා සුදුසු මූල්‍ය ප්‍රකාශන මූලිකාංගය සඳහන් කරන්න.

| ගිණුම | මූල්‍ය ප්‍රකාශන මූලිකාංගය |
|---|---|
| A - ආපසු යැවුම් | ............................................ |
| B - ලද ලාභාංශ | ............................................ |
| C - ඉදිරියට ලද කුලී ආදායම් | ............................................ |
| D - ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | ............................................ |

(36) ව්‍යාපාර ආයතනයක පහත එක් එක් අවස්ථාවට වඩාත්ම උචිත ගුණාත්මක ගති ලක්ෂණය සඳහන් කරන්න.

| අවස්ථාව | ගුණාත්මක ගති ලක්ෂණය |
|---|---|
| A - ආදායම් ප්‍රකාශනයක ප්‍රවර්තන වර්ෂයේ තොරතුරු සමඟ පෙර වර්ෂයේ තොරතුරු දැක්වීම. | ............................................ |
| B - දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණන අගයට වාර්තා කිරීම. | ............................................ |
| C - භාවිත අයිතිය සහිත වත්කම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙනම දැක්වීම. | ............................................ |
| D - මුළු වත්කම් හා වගකීම් ජංගම හා ජංගම නොවන ලෙස වර්ග කිරීම. | ............................................ |

(37) "දිරිය කාන්තාවෝ" සමිති සංවිධානයේ 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගණනය කරන ලද ඌණතාවය රු. 50 000 ක් විය. කෙසේ නමුත් ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීමේදී පහත අයිතම මඟ හැරී තිබුණි. මෙම අයිතම ගැලපීම මගින් ගණනය කරන ලද ඌණතාවය වැඩිවේ නම් (I) අඩු වේ නම් (D) වෙනස් නොවේ නම් (NC) ද යන්න තිත් ඉරි මත දක්වන්න.

| අයිතමය | I/D/NC |
|---|---|
| A - ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු. 2 000 000 ක් පරිත්‍යාග ලැබීම. | ............................................ |
| B - වර්ෂයට අදාළ රු. 8 000 ක විදුලි බිල් උපචිත වී තිබීම. | ............................................ |
| C - හිඟ සාමාජික මුදල් කපා හැරීම. | ............................................ |
| D - යාවජීව සාමාජික මුදලින් වර්ෂයට අදාළ සාමාජික මුදල් හඳුනා නොගැනීම. | ............................................ |

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub
Scanned with CamScanner

- ප්‍රශ්න අංක 38 හා 39 ට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු භාවිතා කරන්න.

අතුල හා බුහාරි 3 : 2 අනුපාතයට ලාභාලාභ බෙදාගනිමින් පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයට 2025.04.01 දින චරිත් බඳවා ගන්නා ලදී. මෙදින චරිත් ප්‍රාග්ධනය හා කීර්තිනාමය වෙනුවෙන් රු. 2 000 000 ක් රැගෙන එන ලදී. එදිනට කීර්තිනාමය රු. 18 00 000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. කීර්තිනාමය හවුල් කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුලින් ගැලපීම සිදු කෙරේ. නව ලාභාලාභ අනුපාතය අතුල, බුහාරි හා චරිත් අතර පිළිවෙලින් 3 : 2 : 1 ක් විය. සෑම හවුල්කරුවෙකුටම රු. 240 000 ක වාර්ෂික වේතනයක් හිමිය. 2025.03.31 දිනට අතුල හා බුහාරිගේ ප්‍රාග්ධන ගිණුම් හා ජංගම ගිණුම් ශේෂ පහත පරිදි විය.

| | අතුල (රු.) | බුහාරි (රු.) |
|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම් | 4000,000 | 3 000 000 |
| ජංගම ගිණුම් | 300 000 | 200 000 |

වර්ෂය තුළ චරිත් පමණක් රු. 150 000 ක් මුදලින් ගැනිලි සිදුකරන ලද අතර අනෙක් හවුල්කරුවන් ගැනිලි සිදුකර නොමැත. 2026.03.31 දිනට චරිත්ගේ ජංගම ගිණුමේ ශේෂය රු. 200 000 කි.

(38) 2025.04.01 දිනට නව හවුල්කරුගේ කීර්තිනාම කොටස පමණක් ගැලපීම සඳහා ජර්නල් සටහන ලියා දක්වන්න. (සංලක්ෂ්‍යය අවශ්‍ය නොවේ.)

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

(39) 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ලාභය රු. ..............................................

(40) මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුව (2018) අනුව පහත ප්‍රකාශ සත්‍ය ද, අසත්‍යය ද යන්න දක්වන්න. ( ✓ ලකුණක් යොදන්න.)

| | | සත්‍ය | අසත්‍යය |
|---|---|---|---|
| (1) | වාර්තාකරණ ඒකකයට අඛණ්ඩ පැවැත්මක් ඇතැයි උපකල්පනය කර මූල්‍ය වාර්තා පිළියෙල කෙරේ. | .............. | .............. |
| (2) | පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන කළමනාකරුවන්ගේ අවශ්‍යතාවය මත පිළියෙල කරනු ලබයි. | .............. | .............. |
| (3) | "සත්‍යාපනය කළ හැකි බව" මූල්‍ය ප්‍රකාශනයන් හි විශ්වසනීය තත්ත්වය ඇතිකරන වැඩි දියුණු කිරීමේ ගුණාත්මක ගති ලක්ෂණයකි. | .............. | .............. |
| (4) | අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ආයතනයක් විසින් පාලනය කරනු ලබන ආර්ථික සම්පත් වත්කම් ලෙස හඳුනාගනු ලබයි. | .............. | .............. |

(41) LKAS - 8 (ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස් වීම් සහ වැරදි) ප්‍රමිතියට අනුව පහත ප්‍රකාශ සම්පූර්ණ කරන්න.

(අ) වත්කමක ක්ෂය ක්‍රමය වෙනස් කිරීම .............................................. වෙනස් වීමක් ලෙසත් වත්කමක ඵලදායි ජීව කාලය වෙනස් වීම .............................................. වෙනස්වීමක් ලෙසත් හඳුන්වනු ලබයි.

(ආ) ප්‍රායෝගිකව සිදුකල නොහැකි අවස්ථාවල හැර පෙර කාලච්ඡේද ප්‍රමාණාත්මක වැරදි මූල්‍ය ප්‍රකාශනවල .............................................. නිවැරදි කරනු ලබයි.

(42) 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත මිහිරි පොදු සමාගමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2026.05.20 දින අධ්‍යක්ෂවරුන් විසින් අනුමත කරන ලදී.

LKAS - 10 (වාර්තාකරණ කාලච්ඡේදයට පසු සිදුවීම්) ප්‍රමිතියට අනුව 2026.04.01 දින සිට 2026.05.20 දින දක්වා කාලය තුල සිදු වූ එක් එක් සිදුවීම ගළපන සිදුවීමක් ද නොගළපන සිදුවීමක්ද යන්න සඳහන් කරන්න.

| | සිදුවීම | ගළපන / නොගළපන |
|---|---|---|
| 1. | 2026.03.31 දිනට තොගය රු. 800 000 ක් අධිගණනය කර තිබූ බව අනාවරණය වීම | .............................. |
| 2. | රු. 1 000 000 ක සංචිත ප්‍රාග්ධනිත කිරීම. | .............................. |
| 3. | 2026.03.31 දිනට තිබූ රු. 12 000 ක ණයගැති ශේෂයක් අයකර ගත නොහැකි බව තහවුරු වීම. | .............................. |
| 4. | සාමාන්‍ය කොටස් හිමියන්ට රු. 500 000 අවසන් ලාභාංශයක් ගෙවීමට තීරණය කිරීම. | .............................. |

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
Scanned with CamScanner

(43) සීමිත මිල්රෝයි සමාගමේ 2025.04.01 දිනට සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය රුපියල් මිලියන 12 ක් වූ අතර එය කොටස් 100 000 කින් සමන්විත විය. එදිනට රු. 800 000 රඳවාගත් ඉපයුම් ශේෂයක් ද විය.

2026.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී පහත ගනුදෙනු සිදු වී ඇත.

(1) 2025.04.01 දිනට පැවති සෑම කොටස් 5 ට එක බැගින් රු. 15 බැගින් වූ කොටස් නිකුත් කරමින් රඳවාගත් ඉපයුම් ප්‍රාග්ධනිත කරන ලදී.

(2) 2026.01.01 දිනට පැවති සෑම කොටස් 10 ට එක බැගින් රු. 50 බැගින් වූ කොටස් හිමිකම් නිකුතුවක් කරන ලදී. එහිදී මෙම නිකුතුවෙන් 80% පමණක් මුදල් ලැබුණු අතර ඉතිරි කොටස් මිලදී ගෙන නොතිබුණි.

2026.03.31 දිනට,

(අ) සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය (රු. 000) ........................................

(ආ) මුළු හිමිකම (රු. 000) ........................................

(44) SLFRS - 15 (ගනුදෙනුකරුවන් සමග ගිවිසුම්වලින් අයභාරය) ප්‍රමිතියට අනුව පහත ප්‍රකාශ සම්පූර්ණ කරන්න.

(අ) ආයතනයක් විසින් ගනුදෙනුකරුට සැපයීමට පොරොන්දු වූ භාණ්ඩ හා සේවා තොගයේ වටිනාකම ........................................ ලෙස හැඳින් වේ.

(ආ) ගනුදෙනුකරු සමඟ ඇතිකරගත් ගිවිසුමට අනුව ........................................ තෘප්තිමත් කළ විට ........................................ හඳුනාගත යුතුය.

(45) පහත තොරතුරු 2026 මාර්තු මාසය සඳහා තොග හා අදාළ වේ.

| දිනය | විස්තරය | ප්‍රමාණය (ඒකක) | ඒකකයක පිරිවැය (රු.) |
|---|---|---|---|
| 2026.03.01 | ශේෂය | 2 500 | 200 |
| 2026.03.02 | ගැනුම් | 4 000 | 250 |
| 2026.03.10 | විකුණුම් | 4 000 | |

සමාගම තොග නිකුත් කිරීම සඳහා පෙර පිවිසි- පෙර පිට (FIFO) ක්‍රමය භාවිතා කරයි. 2026.03.31 දිනට ඉතිරි තොගයේ ඒකකගත ශුද්ධ උපලබ්ධි අගය රු. 220 ක් විය.

LKAS - 02 (තොග) ප්‍රමිතියට අනුව 2026.03.31 දිනට

(1) විකුණුම් පිරිවැය (රු. 000) ........................................

(2) තොගයේ අගය (රු. 000) ........................................

(46) සීමිත රාධිකා නිෂ්පාදන සමාගමේ භාවිතා කරන අමු ද්‍රව්‍ය පිළිබඳ පහත තොරතුරු සැපයේ.

- වාර්ෂික පරිභෝජනය ඒකක 3000
- යලි ඇණවුම් මට්ටම ඒකක 200
- ඇණවුමක පිරිවැය රු. 300
- ඒකකයක රඳවාගැනීමේ පිරිවැය රු. 5

(අ) ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ) ඒකක ........................................

(ආ) වාර්ෂික ඇණවුම් පිරිවැය රු. ........................................

(ඇ) වාර්ෂික රඳවාගැනීමේ පිරිවැය රු. ........................................

(47) තනි භාණ්ඩයක් නිෂ්පාදනය කරන ආයතනයක එකලස් හා නිමැවුම් ලෙස නිෂ්පාදන අංශ දෙකක් පවතී. ඒ හා සම්බන්ධව පහත තොරතුරු දැකිය හැකිය.

| විස්තරය | එකලස් අංශය | නිමැවුම් අංශය |
|---|---|---|
| මුළු පොදු කාර්ය පිරිවැය | 1 200 000 | 900 000 |
| ඒකකයකට අන්තර්ග්‍රහණය කල පොදු කාර්ය පිරිවැය | 40 | 150 |
| ඒකකයක් යෙදවීමට ගතවන පැය ගණන | 02 | 05 |

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub
Scanned with CamScanner

එකලස් දෙපාර්තමේන්තුව යන්ත්‍ර පැය මතද නිමැවුම් දෙපාර්තමේන්තුව ශ්‍රම පැය මතද පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කෙරේ. පහත දෑ ගණනය කරන්න.

| | | එකලස් අංශය | නිමැවුම් අංශය |
|---|---|---|---|
| (අ) | පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය (පැයකට) රු. | ........................ | ........................ |
| (ආ) | වැඩකරන ලද මුළු පැය ගණන | ........................ | ........................ |

(48) පිරිවැය පරිමා ලාභ විශ්ලේෂණය සම්බන්ධයෙන් පහත දැක්වෙන ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

| | | සත්‍ය | අසත්‍යය |
|---|---|---|---|
| A - | ඒකකයක විකුණුම් මිල වැඩිවීම සමච්ඡේදන ලක්ෂය අඩු වීමට හේතු වේ. | ............ | ............ |
| B - | ඒකක දායකය අඩුවීම සමච්ඡේදන ලක්ෂයෙහි ඒකක ගණන අඩුවීමට හේතු වේ. | ............ | ............ |
| C - | දායක විකුණුම් අනුපාතයේ වැඩිවීම සමච්ඡේදන ලක්ෂයේ වටිනාකම අඩුවීමට හේතුවේ. | ............ | ............ |
| D - | සමච්ඡේදන ලක්ෂයෙන් ඔබ්බට ඒකක දායකය ඒකකයක ලාභයට සමාන වේ. | ............ | ............ |

(49) සීමිත සුපුන් සමාගම තනි භාණ්ඩයක් නිෂ්පාදනය කර විකුණනු ලබයි. ඒකකයක විකුණුම් මිල රු. 80 වන අතර ඒකක 18 000 ක් විකුණන්නේ නම්, ඒකකයක අලාභය රු. 15 කි. ඒකක 45000 ක් විකුණන්නේ නම් ඒකකයක ලාභය රු. 6 කි.

පහත දෑ ගණනය කරන්න.

(අ) මුළු ස්ථාවර පිරිවැය (රු. 000) ........................................

(ආ) ඒකක දායකය රු. ........................................

(ඉ) සමච්ඡේදන ලක්ෂය ඒකක ........................................

(50) සීමිත මාලක සමාගම නව යන්ත්‍රයක් අත්පත් කරගැනීමට සලකා බලමින් සිටී. ඒ පිළිබඳව පහත තොරතුරු සැපයේ.

- යන්ත්‍රයේ පිරිවැය — රු. 2 400 000
- ඵලදායි ජීව කාලය — වර්ෂ 5
- සුන්බුන් අගය — රු. 400 000
- පිළිගෙවුම් කාලය — වර්ෂ 2 මාස 8

| වර්ෂය | වාර්ෂික ශුද්ධ මුදල් ප්‍රවාහය (රු. 000) |
|---|---|
| 1 | 700 |
| 2 | 900 |
| 3 | ? |
| 4 | 1400 |
| 5 | 1620 |

තුන්වන වර්ෂය සඳහා පහත දෑ දක්වන්න.

(අ) ශුද්ධ මුදල් ප්‍රවාහය (රු. 000)

(ආ) ලාභය (රු. 000)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
Scanned with CamScanner

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**Provincial Department of Education - NWP**

**තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2026**

**Third Term Test - Grade 13 - 2026**

විභාග අංකය: ....................................

# ගිණුම්කරණය - II

කාලය පැය 03 යි

(අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි)

උපදෙස්:-

- පළමුවන ප්‍රශ්නය හා දෙවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු ලිවීම අලුත් කඩදාසියකින් ආරම්භ කරන්න .
- අදාළ පෙරවැඩ පිළිතුරු පත්‍රය සමග අමුණන්න.

---

(01) සීමිත විසල් පොදු සමාගමේ 2026.03.31 දිනට සාරාංශගත ශේෂ පිරික්සුම පහත දී ඇත.

| | හර (රු. '000) | බැර (රු. '000) |
|---|---|---|
| දේපල, පිරියත හා උපකරණ | 115000 | |
| දේපළ, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂය (2025.04.01 දිනට) | | 11000 |
| විකුණුම් අයභාරය | | 80000 |
| විකුණුම් පිරිවැය | 37500 | |
| භාවිත අයිතිය සහිත වත්කම් | 2500 | |
| තොගය | 3200 | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 23500 | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | | 13000 |
| 20% බැංකු ණය (2025.10.01 දින ලබාගත්) | | 5000 |
| බෙදාහැරීමේ පිරිවැය | 6300 | |
| පරිපාලන වියදම් | 5400 | |
| වෙනත් වියදම් | 450 | |
| මූල්‍ය පිරිවැය | 250 | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | | 80000 |
| ප්‍රත්‍යාගණන සංචිතය (2025.04.01 දිනට) | | 10000 |
| රඳවාගත් ඉපැයුම් (2025.04.01 දිනට) | | 12000 |
| ගෙවූ ලාභාංශ | 2000 | |
| වගකීම් සඳහා ප්‍රතිපාදන (2025.04.01 දිනට) | | 4700 |
| ගෙවූ ආදායම් බදු | 9000 | |
| ආදායම් බදු සඳහා ප්‍රතිපාදන (2025.04.01 දිනට) | | 1500 |
| මුදල් | 12100 | |
| | 217200 | 217200 |

අතිරේක තොරතුරු

2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර පහත දෑ සඳහා ගැළපීම් කළයුතු වේ.

(i) 2026.03.31 දිනට තොගයේ පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය පිළිවෙලින් 3,200,000 ක් සහ 4,000,000 ක් විය. 2026.05.01 දින සම්පූර්ණ තොගය 3,000,000 කට විකුණා ඇත. මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂකවරු විසින් 2026.06.15 දින අනුමැතිය ලබා දුනි.

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
Scanned with CamScanner

(ii) පරිපාලන වියදම් තුළ අධ්‍යක්ෂවරුන්ට ගෙවූ දුරකථන ගාස්තු රු. 200,000 ක් හා ගෙවූ විගණන ගාස්තු රු. 600,000 ක් ද ඇතුලත් වේ.

(iii) 2026.03.31 දින විගණන ගාස්තු රු. 200,000 ක්හා බැංකු ණය පොළී රු. 250,000 ක් උපචිතව ඇති අතර ඉදිරි වර්ෂය සඳහා ගෙවන ලද බෙදා හැරීමේරථ රක්ෂණ ගාස්තු රු. 120,000 ක් බෙදා හැරීමේ වියදම් තුල ඇතුලත් වේ. ගෙවූ ණය පොළී පමණක් මූල්‍ය පිරිවැය තුළ ඇතුලත් වේ.

(iv) දේපල, පිරියත හා උපකරණවල විස්තර පහත වේ.

| විස්තරය | 2026.03.31 දිනට පිරිවැය / අගය (රු. '000) | 2025.04.01 දිනට සමුච්චිත ක්ෂය (රු. '000) |
|---|---|---|
| ඉඩම් | 60,000 | - |
| ගොඩනැගිලි | 30,000 | 6,000 |
| බෙදාහැරීමේ රථ | 25,000 | 5,000 |
| | 115,000 | 11,000 |

- සියලුම ක්ෂය කළහැකි දේපල පිරියත උපකරණ 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.
- 2023 වර්ෂයේ සමාගම විසින් ඉඩම් එදිනට සාධාරණ අගය රු. 60,000,000 ප්‍රත්‍යාගණනය කරන ලදුව ඒ තුළින් ඇති වූ අතිරික්තය ප්‍රත්‍යාගණන සංචිතය තුළින් නිරූපණය වේ. 2025.04.01 දින ඉඩම් නැවත ප්‍රත්‍යාගණනය කිරීමෙන් රු. 4,000,000 ක් හිඟයක් ඇති වී තිබුණි. මෙම ප්‍රත්‍යාගණනය සම්බන්ධයෙන් කිසිදු සටහනක් තබා නැත.
- 2025.04.01 දින සමාගම විසින් ගොඩනැගිලි ප්‍රථම වරට ප්‍රත්‍යාගණනය කරන ලදුව ඒ තුළින් රු. 5,000,000 අතිරික්තයක් ඇතිවිය. මේ සම්බන්ධයෙන් කිසිදු සටහනක් තබා නැත. ගොඩනැගිලිවල ඉතිරි ඵලදායි ජීවකාලය වසර 10 කි.
- 2025.10.01 දින රු. 4,800,000 වටිනා මෝටර් රථයක් පරිපාලන කටයුතු සඳහා මිලදී ගෙන ඇති අතර ඒ පිළිබඳව කිසිඳු සටහනක් තබා නැත.

(v) සමාගම විසින් වසරක වගකීම් සහතිකයක් සහිතව භාණ්ඩ විකුණනු ලබයි. පෙර වසර අත්දැකීම් මත ප්‍රවර්තන වර්ෂය සඳහා විකුණුම් අයභාරය මත 5% ක ප්‍රතිපාදනයක් කළ යුතු යැයි විශ්වසනීය ලෙස ඇස්තමේන්තු කර ඇත.

(vi) යන්ත්‍රයක භාවිත අයිතිය වසර 5 ක කාලයකට ලබාගැනීම සඳහා 2026.03.31 දින සමාගම කල්බදු ගිවිසුමකට එළඹෙන ලදී. කල්බදු ගිවිසුමට අනුව 2026.03.31 දින රු. 2,500,000 මූලික ගෙවීමක් සිදුකරන ලදී. කල්බදු කාලය තුළ ගෙවිය යුතු වාරිකවල වර්තමාන අගය රු. 3,500,000 කි. 2027.03.31 දින සිට සෑම වර්ෂයක් අවසානයේ ගෙවිය යුතු කල්බදු වාරිකයක් රු. 971,000 කි. එදිනට අදාළ කල්බදු පොළිය රු. 420,000 කි. මූලිකව ගෙවන ලද රු. 2,500,000 පමණක් භාවිත අයිතිය වත්කම් ලෙස හඳුනාගෙන ඇත. වෙනත් කිසිඳු සටහනක් තබා නැත.

(vii) අධ්‍යක්ෂකවරු මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අනුමැතිය දුන් 2026.06.15 දිනට පෙර පහත සිද්ධීන් ද සිදු විය.

- 2025 නොවැම්බර් මස අගදී සිදු වූ හදිසි ගංවතුර ආපදා තත්ත්වය නිසා රු. 7,500,000 ක් වටිනා තොගයක් හානි විය. ඒ සඳහා රක්ෂණ වන්දි ඉල්ලුම් කරන ලදුව එම වටිනාකමින් 80% ක් වන්දි ගෙවීමට රක්ෂණ සමාගම එකඟතාවය පළකර ඇත. ඒ පිළිබඳ ගැලපීම් සිදුකර නැත.
- 2026.04.10 දින සමාගම විසින් විකුණන ලද රු. 2,000,000 ක භාණ්ඩ ගුණාත්වයෙන් යුතු භාණ්ඩ නොවීම නිසා එම වටිනාකම ලබාගැනීමට සමාගමට විරුද්ධව ගනුදෙනුකරු නඩු පවරා ඇත. ඒ පිළිබඳ සමාගමේ නීතිඥවරයාගෙන් විමසන ලදුව එම වටිනාකමින් 75% ක් වන්දි ගෙවීමට සිදුවන බව 2026.04.30 දින විශ්වසනීය ලෙස දැනුම් දුනි.

(viii) වර්ෂය තුළ රු. 5,000,000 ක හිමිකම් නිකුතුවක් සිදුකරන ලද අතර ඒ පිළිබඳව නිසි පරිදි ගිණුම් තබා ඇත.

(ix) ගෙවන ලද ආදායම් බදු තුළ පෙර වර්ෂය සඳහා ගෙවූ රු. 1,800,000 ක් හා ප්‍රවර්තන වර්ෂයේ ප්‍රථම කාර්තු තුන (03) සඳහා ගෙවූ ආදායම් බදු ද ඇතුළත් වේ. ප්‍රවර්තන වර්ෂයේ අවසාන කාර්තුවේ ගෙවිය යුතු බදු වගකීම රු. 3,000,000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(x) සමාගම විසින් බැංකු ණය ලබාගෙන ඇත්තේ ව්‍යාපාරයේ තොග ඇපයට තැබීමෙනි.

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
Scanned with CamScanner

අවශ්‍ය වන්නේ,

LKAS - 1 "මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම" ප්‍රමිතියට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත විසල් පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන් ද ඇතුළුව)

1) 2026-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය.
2) 2026-03-31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය.
3) 2026-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය.

(ලකුණු 40)

(02) (අ) "සිරිපාල" වෙළෙඳ ව්‍යාපාරයේ 2026.03.31 න් අවසන් මාසය සඳහා භාණ්ඩ ලැබීම හා නිකුත් කිරීම පහත දැක්වේ.

| දිනය | විස්තරය | ප්‍රමාණය ඒකක | ඒකකයක මිල රු. |
|---|---|---|---|
| 2026.03.01 | ශේෂය | 200 | 80 |
| 2026.03.03 | ගැනුම් | 1 000 | 90 |
| 2026.03.06 | නිකුත් කිරීම | 500 | |
| 2026.03.10 | ගැනුම් | 1 000 | 120 |
| 2026.03.13 | නිකුත් කිරීම | 1 000 | |
| 2026.03.18 | ආපසු එවුම් (2026.03.10 මිලට ගත්) | 100 | |
| 2026.03.20 | නිකුත් කිරීම | 700 | |
| 2026.03.25 | ගැනුම් | 1 000 | 150 |

අතිරේක තොරතුරු

(i) ව්‍යාපාරය තොග අගය කරන්නේ FIFO ක්‍රමය මත වේ.
(ii) දිනක අවම පරිභෝජනය ඒකක 200 කි.
(iii) දිනක උපරිම පරිභෝජනය ඒකක 1000 කි.
(iv) උපරිම පොරොත්තු කාලය දින 15 කි.
(v) අවම පොරොත්තු කාලය දින 07 කි.
(vi) කාලච්ඡේදය තුළ සෑම මිලදී ගැනීමක්ම සමාන ප්‍රමාණයන්ගෙන් සිදු වේ.

අවශ්‍ය වන්නේ,

1) තොග ගබඩා ලෙජරය පිළියෙල කිරීම. 2) මාර්තු මාසයේ විකුණුම් පිරිවැය
3) භාණ්ඩයක විකුණුම් මිල රුපියල් 250 ක් නම් දළ ලාභය
4) ව්‍යාපාරයේ මාර්තු මාසය අවසානයේ තොගයේ ශුද්ධ උපලබ්ධි අගය රුපියල් 100,000 ක් වන්නේ නම් අවසාන තොගය ගිණුම්ගත කිරීමට අදාළ ජ'නල් සටහන
5) i) යළි ඇණවුම් මට්ටම ii) උපරිම තොග මට්ටම.

(ලකුණු 16)

(ආ) සීමිත කසුන් සමාගම x හා y නමින් භාණ්ඩ වර්ග දෙකක් නිෂ්පාදනය කර අලෙවි කරයි. එක් එක් නිෂ්පාදනය එකලස් කිරීම හා නිම කිරීම යන නිෂ්පාදන ක්‍රියාවලීන් දෙක පසු කරයි. සමාගමේ ගබඩා නමින් සේවා අංශයක් ද පවතී. ඇස්තමේන්තුගත වාර්ෂික පොදු කාර්ය පිරිවැය පහත දැක්වේ.

| | | | රුපියල් |
|---|---|---|---|
| වක්‍ර ශ්‍රමය | එකලස් | 594 000 | |
| | නිමැවුම් | 191 000 | |
| | ගබඩා | 95 000 | 880 000 |
| වක්‍ර ද්‍රව්‍ය | එකලස් | 40 000 | |
| | නිමැවුම් | 20 000 | |
| | ගබඩා | 10 000 | 70 000 |
| ගබඩා අංශයේ කළමනාකරණ වැටුප් | | | 50 000 |
| කම්හල් කුලී | | | 60 000 |
| යන්ත්‍ර ක්ෂය | | | 100 000 |
| විදුලිය | | | 80 000 |
| සේවක රක්ෂණය | | | 20 000 |
| පිරිසිදු කිරීම | | | 10 000 |

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub
Scanned with CamScanner

අනෙකුත් තොරතුරු

(i) නිෂ්පාදන අංශවල භූමිය විශේෂයෙන් පිරිසිදු කළ යුතු අතර ඒ සඳහා ඇස්තමේන්තුගත වියදම් ඉහත පිරිසිදු කිරීම තුළින් දැක්වේ.

(ii) කර්මාන්ත ශාලාව පිළිබඳ පහත තොරතුරු ඉදිරිපත් කර ඇත.

| | එකලස් | නිමැවුම් | ගබඩා |
|---|---|---|---|
| බිම් ප්‍රමාණය වර්ග මීටර් | 90 000 | 60 000 | 30 000 |
| යන්ත්‍ර වටිනාකම රුපියල් | 500 000 | 300 000 | 200 000 |
| කිලෝවොට් පැය | 4 000 | 3 000 | 1 000 |
| සේවක සංඛ්‍යාව | 10 | 5 | 5 |
| ගබඩා අධියාචනා පත්‍ර සංඛ්‍යාව | 1 000 | 500 | |
| අයවැයගත යන්ත්‍ර පැය ගණන | 44 500 | 40 000 | |
| අයවැයගත ශ්‍රම පැය ගණන | 36 000 | 38 000 | |

(iii) සත්‍ය සෘජු පිරිවැය

| | X | Y |
|---|---|---|
| ඒකකයක සෘජු ද්‍රව්‍ය පිරිවැය | 300 | 200 |
| ඒකකයක සෘජු ශ්‍රම පිරිවැය | 500 | 300 |
| ඒකකයක සෘජු වෙනත් පිරිවැය | සෘජු ද්‍රව්‍ය පිරිවැයෙන් 80% | සෘජු ශ්‍රම පිරිවැයෙන් 25% |

(iv) එකලස් දෙපාර්තමේන්තුව යන්ත්‍ර පැය මත ද නිමැවුම් දෙපාර්තමේන්තුව ශ්‍රම පැය මත ද පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කෙරේ.

(v) භාණ්ඩ ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා එකලස් දෙපාර්තමේන්තුවෙන් යන්ත්‍ර පැය 2 ක් ද නිමැවුම් දෙපාර්තමේන්තුවෙන් ශ්‍රම පැය 3 ක් ද ගත කරයි.

(vi) ගබඩාවේ මුළු පොදු කාර්ය පිරිවැය එකලස් සහ නිමැවුම් දෙපාර්තමේන්තු අතර පිළිවෙලින් 3 : 2 අනුපාතයට නැවත විභජනය කරනු ලැබේ.

අවශ්‍ය වන්නේ,

1) විභජන පදනම් පැහැදිලිව දක්වමින් පොදු කාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව (ද්විතියික විභාජනය සහිතව)

2) එකලස් හා නිමැවුම් දෙපාර්තමේනතු සඳහා පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත

3) X සහ Y භාණ්ඩ ඒකකයක මුළු නිෂ්පාදන පිරිවැය වෙන් වෙන්ව

4) නිෂ්පාදන පිරිවැය මත 20% ක ලාභාන්තිකයක් පවත්වාගන්නේ නම් X භාණ්ඩ ඒකක 1 000 ක් විකිණීමෙන් ලබන ලාභය.

(ලකුණු 24)

(මුළු ලකුණු 40)

03) (අ) මහා පරිමාණ විදුලි උපකරණ විකිණීමේ ව්‍යාපාරයක් 2024 අප්‍රේල් 01 දින ආරම්භකරන ලද සීමිත රබිත පොදු සමාගම එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියා පදිංචි වී ඇත. 2026.04.01 දින සිට 2026.06.30 දින දක්වා පළමු කාර්තුව තුළ සිදුවූ ගනුදෙනුවල බලපෑම ගිණුම්කරණ සමීකරණය තුළින් නිරූපණය වේ. රටේ පැවති අයහපත් තත්ත්වය නිසා ආදායම් බදු නිදහස් කර ඇත.

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
Scanned with CamScanner

(රු. 000)

| ශේෂය හා ගනුදෙනු | වත්කම = | | | | වගකීම + | | | හිමිකම | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දේපල පිරියත හා උපකරණ භාවිත අයිතිය ඇති වත්කම් | තොගය | වෙළෙඳ ලැබිය යුතු දෑ | මුදල් හා මුදල් සමාන දෑ | කල්බදු වගකීම | VAT | වෙළෙඳ ගෙවිය යුතු දෑ | සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | ප්‍රත්‍යාගණන සංචිත | රඳවාගත් ඉපැයුම් |
| 26/4/1 ශේෂ | 6500 | 2300 | 2500 | 700 | 4000 | 200 | 800 | 5000 | - | 2000 |
| 1 | | -1400 | +2360 | | | +360 | | | | +600 |
| 2 | | | -2000 | +1800 | | | | | | -200 |
| 3 | | +1000 | | | | -180 | +1180 | | | |
| 4 | | -300 | | | | +54 | - 354 | | | |
| 5 | | | | -720 | | | - 800 | | | +80 |
| 6 | +1500 | | | | | | | | +1500 | |
| 7 | | | -50 | | | | | | | -50 |
| 8 | | | | +2000 | | | | +2500 | | -500 |
| 9 | | -40 | | | | | | | | -40 |
| 10 | | | | -200 | | -200 | | | | |
| 11 | | | | -400 | | | | | | -400 |
| 12 | | | | -205 | +5 -205 | | | | | -5 |
| 13 | | | -10 | | | | -10 | | | |
| 14 | -90 | | | | | | | | | -90 |
| 26/06/30 දිනට ශේෂ | 7910 | 1560 | 2800 | 2975 | 3800 | 234 | 816 | 7500 | 1500 | 1395 |

කාර්තුව තුළ ලාභාංශ ගෙවීමක් සිදුකර නැත.

අවශ්‍ය වන්නේ,

1) ඉහත අංක 1 සිට 14 දක්වා ඇති එක් එක් ගනුදෙනු වටිනාකම් සහිතව විස්තර කිරීම.

2) වෙනත් විස්තීර්ණ ආදායම් හා මුළු විස්තීර්ණ ආදායමෙහි වටිනාකම. (ල. 30)

(ආ) සාමාජික සංඛ්‍යාව 200 ක් වූ "සමගි" ක්‍රීඩා සමාජයට අදාළව පහත තොරතුරු ඔබ වෙත ඉදිරිපත් කර ඇත.

(i)

| වර්ෂය | සාමාජික මුදල් ලැබිය යුතු සාමාජික සංඛ්‍යාව | | | සාමාජික මුදල් ඉදිරියට ලද සාමාජික සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|
| | මාස 3කට | මාස 2කට | මාස 1කට | මාස 2කට | මාස 1කට |
| 2025.03.31 දිනට | 10 | 20 | 30 | 10 | 20 |
| 2026.03.31 දිනට | - | 20 | 20 | 20 | 40 |

Scanned with CamScanner
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

(ii)

| | 2026/3/31 | 2025/3/31 |
|---|---|---|
| | රු. '000 | රු. '000 |
| ලී බඩු | 94 | 80 |
| ඉඩම | 1200 | 1200 |
| මුදල් | ? | 15 |
| ලිපි ද්‍රව්‍ය තොග | 2 | 4 |

(ii) එක් අයෙකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 1,200 කි.

(iii) වර්ෂය ආරම්භයේ මාස 03 ක් හිග හිටි සාමාජිකයින් ප්‍රවර්තන වර්ෂය සඳහා ද සාමාජික මුදල් ගෙවා නොමැති බැවින් නොලද සාමාජික මුදල් කපා හැරීමටත් ඔවුන්ගේ සාමාජිකත්වය අහෝසි කිරීමටත් තීරණය කර ඇත.

(iv) වර්ෂය තුළ මුදලින් රු. 200,000 ක පරිත්‍යාගයක් ලැබී ඇති අතර රු. 20,000 ක ලී බඩු උපකරණ මිලදී ගෙන ඇත. එමෙන්ම වර්ෂය තුළ රු. 10,000 ක ලිපිද්‍රව්‍ය තොග මිලදී ගෙන ඇත.

(v) රු. 20,000 ක මෙහෙයුම් වියදම් වර්ෂය තුල දී දරා ඇත.

අවශ්‍ය වන්නේ,

1) 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

(a) සාමාජික මුදල් ගිණුම

(b) මුදල් ගිණුම

(c) ආදායම් ප්‍රකාශනය (ල. 15)

(ලකුණු 40)

(04) (අ) සීමා සහිත ඩේවිඩ් පොදු සමාගම සිල්ලර වෙළෙඳ කටයුතු වල නිරත ව්‍යාපාරයකි. සමාගම එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වී ඇත. VAT 10%කි.

2026.04.01 දිනට තිබූ ගිණුම් ශේෂ කිහිපයක් පහත වේ.

| | රු. '000 |
|---|---|
| මුදල් | 360 |
| වෙළෙඳ ණයගැති පාලන ගිණුම | 180 |
| වෙළෙඳ ණයහිමි පාලන ගිණුම | 120 |
| VAT පාලන ගිණුම (බැර) | 80 |
| කල්බදු වගකීම | 3200 |
| ගෙවිය යුතු වැටුප් | 540 |

2026 අප්‍රේල් මාසය තුළ පහත ගනුදෙනු සිදුවිය.

(i)

| මාසය තුළ විකුණුම් | | VAT සහිත විකුණුම් මිල (රු. '000) |
|---|---|---|
| 4/2 | අත්පිට විකුණුම් | 1650 |
| 4/3 | සී/ස මෛත්‍රී පොදු සමාගම | 2750 |
| 4/15 | සී/ස කසුන්දි පොදු සමාගම | 880 |

(ii)

| මාසය තුළ ගැනුම් | | VAT රහිත ගැනුම් මිල (රු. '000) |
|---|---|---|
| 4/3 | අත්පිට ගැනුම් | 400 |
| 4/5 | සී/ස කිසුම් පොදු සමාගම | 1200 |
| 4/10 | සී/ස එනුල් පොදු සමාගම | 600 |

(iii) මාසය තුළ මුදල් ලැබීම් හා ගෙවීම් සාරාංශය

4/3 ආරම්භක ණයගැති ශේෂය සම්පූර්ණයෙන් පියවීම සඳහා 10% ක වට්ටමකට යටත්ව මුදල් ලැබුණි.

4/8 සී/ස කසුන්දි පොදු සමාගමේ ණයගැති ශේෂයෙන් අඩක් පියවීමට 5% ක වට්ටමකට යටත්ව මුදල් ලැබුණි.

4/10 රු. 1,200,000 ක බැංකු ණයක් ලබා ගැනීම.

4/20 රු. 48,000 ක් කුලී ආදායම් ලැබීම.

4/25 රු. 100 ක් බැගින් වූ සාමාන්‍ය කොටස් 100,000 ක් නිකුත් කර මුදල් ලැබීම.

Scanned with CamScanner

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

**මුදල් ගෙවීම**

4/8 ආරම්භක ණය හිමි ශේෂයෙන් අඩක් පියවීමට මුදල් ගෙවීම.
4/10 මාර්තු මාසයේ ගෙවිය යුතු වැටුප් රු. 540,000 ක් ගෙවීම.
4/15 සී/ස එතුල් පොදු සමාගමේ ණයහිමි ශේෂයෙන් රු. 600,000 ක් 10% ක වට්ටමකට යටත්ව ගෙවීම.
4/18 රු. 320,000 ක පොලිය සහිතව රු. 1,000,000 ක කල්බදු වාරිකය ගෙවීම.
4/20 රු. 300,000 ක විගණන ගාස්තු ගෙවීම.
4/25 රු. 150,000 ක් ලාභාංශ ගෙවීම.

අවශ්‍ය වන්නේ,

1) i) මුදල් ලැබීම් ජර්නලය ii) මුදල් ගෙවීම් ජර්නලය
iii) විකුණුම් ජර්නලය iv) ගැනුම් ජර්නලය

2) 2026/04/30 දිනෙන් අවසන් මාසය සඳහා පහත ගිණුම්
i) මුදල් ගිණුම ii) ණයගැති පාලන ගිණුම
iii) ණයහිමි පාලන ගිණුම iv) VAT පාලන ගිණුම

(ලකුණු 30)

(ආ) සමාගමක් විසින් රු. 200,000 ක් වූ නව යන්ත්‍රයක් මිලදී ගැනීමට තීරණය කර ඇත. එහි අපේක්ෂිත ජීවකාලය වසර 5 ක් වන අතර, සුන්බුන් අගය රු. 50,000 ක් වේ. යන්ත්‍රය ගෙනඒමේ කුලිය ලෙස රු. 40,000 ක් දැරිය යුතු වේ. මෙම යන්ත්‍රය නව භාණ්ඩයක් නිපදවීම සඳහා භාවිත කිරීමට අපේක්ෂාකරන අතර, ඇස්තමේන්තු ගත වාර්ෂික නිෂ්පාදන ඒකක ගණන හා මෙහෙයුම් වියදම් පහත පරිදි වේ.

නව යන්ත්‍රය

| වර්ෂය | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| අපේක්ෂිත විකුණුම් ඒකක ගණන | 40 000 | 40 000 | 42 000 | 45 000 | 48 000 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් (ක්ෂය හැර) රු. | 20 000 | 30 000 | 58 000 | 20 000 | 42 000 |

(i) ඒකකයක අපේක්ෂිත විකුණුම් මිල රු. 6 ක්වන අතර ඒකකයක විචල්‍ය පිරිවැය රු. 2 කි. (මෙහෙයුම් වියදම් ගණනය කිරීමේදී විචල්‍ය පිරිවැය සලකා නොමැත.)

(ii) නව යන්ත්‍රය මිලට ගැනීමේදී කාරක ප්‍රාග්ධනය ලෙස රු. 100,000 ක් ආයෝජනය කළ යුතු අතර ඵලදායී ජීවකාලය අවසානයේදී එය ආවරණය කරගත හැකිය.

(iii) ඉහත වියදම් වලට අමතරව දෙවන වසරේදී හා හතරවන වසරේදී රු. 40,000 බැගින් අළුත්වැඩියා කටයුතු සඳහා වියදමක් දැරීමට අපේක්ෂිතය.

(iv) ආයෝජනයේ අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය 10% ක් වන අතර එහි වට්ටම් සාධක පහත පරිදි වේ.

| වර්ෂය | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| වට්ටම් සාධකය | 0.90 | 0.82 | 0.75 | 0.68 | 0.62 |

අවශ්‍ය වන්නේ,

1) එක් එක් අයිතමය පැහැදිලිව දක්වමින් වාර්ෂික ශුද්ධ මුදල් ප්‍රවාහය (මූලික ආයෝජනය ද ඇතුළත්ව)

2) ව්‍යාපෘතියේ පිළිගෙවුම් කාලය.

3) ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය (NPV) හා ඒ මත පදනම් ව මෙම ව්‍යාපෘතියෙහි ආයෝජනය කිරීම සඳහා නිර්දේශය

(ලකුණු 10)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
Scanned with CamScanner

(05) (අ) කවීෂ හා වගීෂ පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයෙන් 2025.04.01 දින වගීෂ ඉවත්ව ගිය අතර, එදිනම නව හවුල්කරුවෙකු ලෙස මතීෂ හවුල්කරුවකු ලෙස බඳවාගන්නා ලදී. ව්‍යාපාරයේ ගිණුම් පොත් හා වාර්තා වගීෂ විසින් පවත්වා ගෙන ගොස් තිබූ අතර ඔහු ඉවත්වීමෙන් පසු නිසි පරිදි ගිණුම් පොත් පවත්වාගෙන නොමැත. 2026.03.31 දිනෙන් අවසන් වර්ෂයට අදාළව පහත තොරතුරු උපුටාගෙන ඇත.

1) 2025.04.01 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | පිරිවැය | සමුච්චිත ක්ෂය | ධාරණ අගය |
|---|---|---|---|
| ජංගම නොවන වත්කම් | | | |
| ඉඩම් | 2 000 | - | 2 000 |
| ගොඩනැගිලි | 2 200 | 700 | 1 500 |
| මෝටර් රථ | 5 000 | 2 000 | 3 000 |
| යන්ත්‍ර උපකරන | 2 000 | 500 | 1 500 |
| | 11 200 | 3 200 | 8 000 |
| ස්ථාවර තැම්පතු | | | 2 000 |
| ජංගම වත්කම් | | | |
| තොගය | | 2 500 | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 5 000 | | |
| හානිකරණ අලාභ සඳහා ඉඩ හැරීම. | (500) | 4 500 | |
| ඉදිරියට ගෙවූ විදුලි වියදම් | | 200 | |
| මුදල් | | 2 300 | 9 500 |
| මුළු වත්කම් | | | 19 500 |
| ප්‍රාග්ධන ගිණුම් කවීෂ | | 5 000 | |
| වගීෂ | | 5 000 | 10 000 |
| ජංගම ගිණුම් කවීෂ | | 800 | |
| වගීෂ | | 1 200 | 2 000 |
| ජංගම නොවන වගකීම් | | | |
| 10% බැංකු ණය | | | 3 000 |
| ජංගම වගකීම් | | | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | | 4 000 | |
| උපචිත ණය පොලී | | 3 300 | |
| උපචිත රක්ෂණ | | 200 | 4 500 |
| | | | 19 500 |

2) 2026.03.31 දිනෙන් අවසසන් වර්ෂයේ පහත තොරතුරු මූලික සටහන් පොත්වලින් උපුටා ගන්නා ලදී.

| | රු. '000 |
|---|---|
| විකුණුම් ජර්නලයේ එකතුව | 18,000 |
| ගැනුම් ජර්නලයේ එකතුව | 10,000 |
| ආපසු එවුම් ජර්නලයේ එකතුව | 100 |
| ආපසු යැවුම් ජර්නලයේ එකතුව | 800 |

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
Scanned with CamScanner

3) මුදල් ලැබීම් හා ගෙවීම් සාරාංශය

<u>මුදල් ලැබීම්</u>

| | (රු. 000) |
|---|---|
| වෙළෙඳ ලැබිය යුතු දෑ වලින් | 19,200 |
| අත්පිට විකුණුම් | 2,000 |
| මතීෂ රැගෙන ආ මුදල් | 4,000 |
| ස්ථාවර තැන්පතු පොලී ආදායම් | 100 |
| <u>මුදල් ගෙවීම්</u> | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ සඳහා ගෙවීම් | 12,000 |
| වැටුප් හා වේතන | 1,200 |
| රක්ෂණ | 400 |
| විදුලිය | 300 |
| දුරකථන | 200 |
| කුලී | 100 |
| වගීෂට ගෙවීම් | 5,000 |
| යන්ත්‍ර උපකරණ මිලට ගැනීම (2025.10.01 මිලදී ගත්) | 1,000 |

4) වෙළෙඳ ලැබිය යුතු දෑ මත 10% ක් හානිකරණ අලාභ සඳහා ඉඩහැරීම කළ යුතුය.

5) වගීෂ ඉවත්වීමේදී ඔහු ගෙවිය යුතු මුළු හිමිකම පියවීමට ගෙවූ මුදලට අමතරව පිරිවැය රු. 2,000,000 ක් හා එදිනට ධාරණ අගය 1,200,000 ක් වූ මෝටර් රථයක් ඉතිරි ගෙවිය යුතු වටිනාකම වෙනුවෙන් පවරා දෙන ලදී. වගීෂ ඉවත්වීම හා මතීෂ බඳවා ගැනීම වෙනුවෙන් කීර්තිනාමය රු. 2,000,000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. (කීර්තිනාමය ප්‍රාග්ධන ගිණුම තුළින් ගැළපීමට හවුල්කරුවන් එකඟ විය.)

6) පැරණි හා නව හවුල් ගිවිසුම් පහත වේ.

| | පැරණි<br>කවීෂ හා වගීෂ | නව<br>කවීෂ හා මතීෂ |
|---|---|---|
| ප්‍රාග්ධන පොලී | 10% | 10% |
| ලාභ කොටස් | සම සමව | සම සමව |
| හවුල් වේතන | මාසිකව රු. 30,000 බැගින් | මාසිකව රු. 30,000 බැගින් |

7) ස්ථාවර තැම්පතු සඳහා වාර්ෂික පොළිය 12% කි.

8) වර්ෂය තුල දුන් වට්ටම් හා ලද වට්ටම් පිළිවෙලින් රු. 500,000 ක් හා රු. 600,000 ක් විය.

9) කවීෂ හා මතීෂ මුල් මාස හයට (6) අදාළ හවුල් වේතන මුදලින් ලබාගෙන ඇති අතර එම වටිනාකම ගෙවූ වැටුප් හා වේතන තුළ ඇතුළත් වේ. තවද ගෙවූ විදුලි වියදම් වලින් රු. 50,000 ක් කවීෂගේ නිවසේ විදුලිය සඳහා ගෙවන ලද්දකි.

10) වර්ෂය තුළ හවුල්කරුවන් විසින් සිදුකළ පහත ගැනිලි පිළිබඳ කිසිඳු සටහනක් පොත්වල තබා නැත.

| | භාණ්ඩ | මුදල් |
|---|---|---|
| කවීෂ | රු. 30,000 | රු. 50,000 |
| මතීෂ | රු. 50,000 | - |

11) ඉඩම් හැර අනෙකුත් සියළු දේපළ, පිරියත හා උපකරණ වාර්ෂිකව සරළ මාර්ග ක්‍රමයට පිරිවැය මත 10% බැගින් ක්ෂය කළ යුතු වේ.

අවශ්‍ය වන්නේ,

(1) 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනය (විසර්ජනයන්ද සහිතව)

(2) 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් හා ජංගම ගිණුම්

12 2026/3/31 දිනට ශුද්ධ ලාභය 27000... (ලකුණු 28)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
Scanned with CamScanner

(ආ) සීමිත දිනායා පොදු සමාගමේ 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ ගිණුම්කරණ දත්ත පහත වේ.

- වර්ෂයේ දළ ලාභය රු. 400,000 ක් වන අතර මුළු වියදම රු. 250,000 ක් වේ.
- දළ ලාභ අනුපාතය විකුණුම් පිරිවැයෙන් 20% ක් වේ.
- වර්ෂයට අදාළ දින ගණන 360 ක් වන අතර තොගය වාර 8 කදී විකුණුම් බවට පත් වේ.
- වර්ෂයේ වත්කම්, විකුණුම්බවට පත්වන වාර ගණන 2 කි.
- මුළු වියදම්වලින් 20% ක් පොලි වියදම් වේ.
- මුළු වත්කම් වලින් 2/5 ක් ජංගම වත්කම් වේ.
- වර්ෂයේ ජංගම වගකීම් රු. 300,000 ක් වන අතර ජංගම නොවන වගකීම් රු. 400,000 කි.
- 2025.04.01 දිනට තොගය රු. 300,000 කි.
- ව්‍යාපාරයේ වෙළෙඳ ලැබිය යුතු දෑ වල සාමාන්‍ය රු. 250,000 ක් වේ.

අවශ්‍ය වන්නේ,

(1) වර්ෂයේ විකුණුම් වටිනාකම
(2) 2026.03.31 දිනට තොගය
(3) හිමිකම මත ඉපයුම් අනුපාතය
(4) ජංගම අනුපාතය හා ඒ පිළිබඳ ඔබගේ අදහස
(5) ක්‍ෂණික අනුපාතය
(6) තොග රඳවා ගැනිමේ කාලය
(7) පොළී ආවරණ අනුපාතය

(ල. 12)

(මුළු ලකුණු 40)

(06) (අ) සීමිත ඉරානි පොදු සමාගමේ 2026.03.31 දිනට හා 2025.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පහත පරිදි වේ.

රු.'000

| | 31.03.2026 | 31.03.2025 |
|---|---|---|
| <u>ජංගම නොවන වත්කම්</u> | | |
| දේපල පිරියත හා උපකරණ | 8600 | 8100 |
| <u>ජංගම වත්කම්</u> | | |
| තොගය | 1400 | 360 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 1110 | 1430 |
| මුදල් | 450 | 370 |
| | 11560 | 10260 |
| <u>හිමිකම</u> | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 3000 | 2200 |
| රඳවාගත් ඉපැයුම් | 3410 | 1460 |
| <u>ජංගම නොවන වගකීම්</u> | | |
| බැංකු ණය | 3590 | 3000 |
| <u>ජංගම වගකීම්</u> | | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | 1450 | 3500 |
| උපචිත පොලී | 40 | 45 |
| උපචිත බදු | 70 | 55 |
| | 11560 | 10260 |

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
Scanned with

අතිරේක තොරතුරු

(i) 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ රඳවා ගත් ඉපැයුම් සඳහා කර ඇති ගැලපීම වන්නේ අතුරු ලාභාංශ වශයෙන් රු. 750,000 සහ වර්ෂයේ ලාභයයි.

(ii) 2026.03.31 දිනෙන් අවසන් වර්ෂයේ බදු වියදම රු. 465,000

(iii) වර්ෂය තුළ ධාරණ අගය රු. 1,350,000 ක් වූ යන්ත්‍රයක් රු. 800,000 කට විකුණා ඇත. විකුණු දින පිරිවැය රු. 2,500,000 කට නව යන්ත්‍රයක් මිලදී ගෙන ඇත.

(iv) ලෙජරයේ පැවැති බැංකු ණය ගිණුම පහත පරිදි වේ.

බැංකු ණය ගිණුම

| | | | |
|---|---|---|---|
| 2026.3.31 ණය ගෙවීම (පොළී හැර) | 410 | 2025.4.1 ඉ/ගෙ ශේෂය | 3000 |
| | | 2025.4.1 ණය ගැනීම | 1000 |
| 2026.3.31 ප/ගෙ ශේෂය | 3590 | | |
| | 4000 | | 4000 |

සියළු බැංකු ණය 12% පොළී අනුපාතයක් යටතේ ලබා ගෙන ඇත.

(v) 2026.3.31 දිනෙන් අවසන් වර්ෂයේ පොළී ආදායම රු. 120,000 ක් වෙනත් ආදායම් තුළ ඇතුළත් වේ.

(vi) 2025.04.01 දින රු. 800,000 ක ප්‍රතිෂ්ඨාවකට හිමිකම් නිකුතුවක් සිදුකර ඇත.

අවශ්‍ය වන්නේ,

LKAS 7 (මුදල් ප්‍රවාහ ප්‍රකාශන) ප්‍රමිතියට අනුව 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය (වක්‍ර ක්‍රමයට) පිළියෙල කරන්න.

(ලකුණු 20)

(ආ) පාසලක 2026 වාණිජ සංගමය විසින් දින 3 ක විනෝද චාරිකාවක් සංවිධානය කිරීමට සැලසුම් කරමින් සිටින අතර, ඔවුන්ගේ සංගමය සතු රු. 100,000 ක අරමුදලෙන් 20% ක් මෙම චාරිකාව සඳහා අවශ්‍ය බස් රථ 2 ක සඳහා යෙදවීමට තීරණය කර ඇත. අනෙකුත් තොරතුරු පහත දැක්වේ.

- චාරිකාවට යන සිසුන්ට ලබාදෙන ටී-ෂර්ට් එකක පිරිවැය රු. 1 200
- බස්රථ සඳහා කුලිය - එක් රථයකට රු. 40 000 බැගින්
- රැගෙන යන සංගීත භාණ්ඩ දෛනික කුලිය - රු. 10 000
- ආහාර පාන සඳහා එක් අයෙකුට දිනකට - රු. 1 600
- නවාතැන් සඳහා - එක් නිවසකට දිනකට රු. 10 000 බැගින් නිවාස 3 ක්
- සංචාරක ස්ථාන නැරඹීමට අවශ්‍ය ටිකට්පත් සඳහා - එක් අයෙකුට රු. 400
- එක් අයෙකුගෙන් අයකිරීමට නියමිත මුළුමුදල රු. 8 400
- සහභාගි වීමට නියමිත සිසුන් ගණන (බස් රථයකට - සාමාජිකයින් 50 බැගින්.) - 100
- ගුරුවරුන් 5 දෙනෙකු චාරිකාවට සහභාගී වන අතර මුදල් අය නොකරයි. ඔවුන්ගේ ආහාර පාන ටිකට්පත් සඳහා වියදම් සිසුන් විසින් දැරිය යුතු වේ.

අවශ්‍ය වන්නේ,

1) චාරිකාව වෙනුවෙන් දැරීමට සිදුවන මුළු ස්ථාවර පිරිවැය හා එක් අයෙකු වෙනුවෙන් දැරීමට සිදුවන පිරිවැය (අයිතම වෙන වෙනම දක්වන්න.)

2) මුළු පිරිවැය ආවරණය කර ගැනීමට සහභාගි විය යුතු සාමාජිකයන් ගණන

3) සියළු පුද්ගලයන් චාරිකාවට සහභාගි වේ නම් අතිරික්තය හෝ ඌනතාවය ගණනය කරන්න.

4) ගුරුවරුන් 5 දෙනා සහ සාමාජිකයන් සියළු දෙනා ද සහභාගි වේ නම් හා ගුරුවරුන්ගේ මුදල් අය නොකරයි.ද නම්, මුළු පිරිවැය ආවරණය කර ගැනීමට එක් සාමාජිකයෙකුගෙන් අයකල යුතු මුදල

(ලකුණු 20)

(මුළු ලකුණු 40)

PAST PAPERS WIKI

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources